**ශීර්ෂය 1 – අතිගරු ජනාධිපති**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 1 - අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අගෝස්තු 03 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත.. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන  බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ප්‍රතිපාදන නිෂ්ඵල වීම** | | |
| වැය ශීර්ෂයේ වැය විෂයයන් 02 කට අදාළව සලසා තිබුණු එකතුව රු.මිලියන 8.10 ක ප්‍රතිපාදනවලින් කිසිඳු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් හා නඩත්තු කිරීම් කටයුත වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය. | මු.රෙ. 50 ප්‍රකාරව තාත්ත්විකව සහ නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |
| **(ආ) අධිප්‍රතිපාදන සැලසීම** | | |
| වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.620,808,200 ක අධිප්‍රතිපාදන සැලසීම නිසා එම ප්‍රතිපාදනවලින් එකතුව රු.388,061,381 ක උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.232,746,819 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 72 ක් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | ප්‍රතිපාදන උපයෝජනය නොකර තිබුණත්, 1508 හා 2003 වැය විෂයයන් වෙනුවෙන් බැරකම්වලට එළඹ තිබුණි. 2202 වැය විෂය සඳහා කාර්යසාධන බලකා කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලයේ ස්ථාපිත කර තිබීම නිසා ප්‍රාග්ධන උපකරණ සඳහා ප්‍රතිපාදන අවශ්‍යතාවය එම කාර්යාලය විසින් සපුරා ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව තාත්ත්විකව සහ නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ සමහර ව්‍යාපෘති 2021 වර්ෂය වන විට වෙනත් අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වී තිබුණි. එම ව්‍යාපෘතිවලින් 2019 වර්ෂයේදී එළඹ තිබුණු එකතුව රු.3,039,495 ක බැරකම් 2021 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ බැරකම් ලෙස භාණ්ඩාගාර පොත්වල සඳහන් කර තිබුණි. එම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි. | භාණ්ඩාගාර පොත් (SA 92) අනුව 2021 දෙසැම්බර් 31 වන දිනට කාර්යාලයේ බැදීම් හා බැරකම් වශයෙන් රුපියල් 129,758,726 ක් ලෙස දක්වා තිබුණද, එහි ඇතුළත්ව තිබූ 2019 වර්ෂයට අදාළව ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ, එහෙත් මේ වන විට වෙනත් අමාත්‍යාංශ යටතේ ක්රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළ බැරකම් අයිතමයන් 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ සටහන (iii) හි ඇතුළත් නොකරන ලද අතර එම වැය විෂයයන් 2021 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ ද ඇතුළත් කර නොමැත. | මූල්‍ය ප්‍රකාශන තුළින් සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් හෙළිදරව් කළ යුතු වීම. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිය ගිය රියදුරු නිලධාරියකුගෙන් ලැබීමට තිබුණු රු.111,780 ක ආපදා ණය ශේෂය 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 ක සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක් මුළුල්ලේ පැවත එමින් තිබුණු අතර, 2022 ජුනි 05 දින වන විට තවදුරටත් අයකර ගත යුතු ණය ශේෂය රු. 104,900 ක් විය. එමෙන්ම හිඟහිටි රු.10,000 ක උත්සව අත්තිකාරම් ණය ශේෂයද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | මියගිය නිලධාරියාගෙන් 2021.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය රු.111,780කි. මෙම හිඟ ණය ශේෂය දැනටමත් ඇපකරුගෙන් අයකරමින් පවතින අතර වර්තමාන ණය ශේෂය රු.104,900 දක්වා අඩු වී ඇත. හිඟ උත්සව අත්තිකාරම් රු.10,000 ණය ශේෂය ණයකරුගේ කලත්‍රයා විසින් වාරික වශයෙන් ගෙවමින් පවතී. | අප්‍රමාදව හිඟහිටි අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් හා උද්‍යාන කම්කරු නිලධාරියකුගෙන් එකතුව රු.259,423 ක දේපල ණය ශේෂය වර්ෂ 5 කට වැඩි කාලයක් මුළුල්ලේ පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇති පරිදි විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.7 වගන්තිය යටතේ තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීම අනුව ණයකරුට හිමිවන විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | අප්‍රමාදව හිඟහිටි අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වැඩ තහනම් කරන ලද රියදුරු නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.190,302 ක ආපදා ණය ශේෂ 2021 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් වර්ෂ 03 ක් හා වර්ෂ 04 ක කාලයක සිට පැවත එමින් තිබුණු අතර 2022 ජුනි 05 දින වන විටත් අය කර ගත යුතු ණය ශේෂය රු.178,910 ක් වී තිබුණි. එමෙන්ම, වැඩ තහනම් කරන ලද රියදුරු නිලධාරියකුගේ රු.129,615 ක ආපදා ණය ශේෂය සහ රු.6,250 ක උත්සව අත්තිකාරම් ණය ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් හා වර්ෂ 03 ක කාලයක සිට පැවත එමින් තිබුණි. 2022 ජුනි 05 දින වන විටත් තවදුරටත් අය කර ගත යුතු ආපදා ණය ශේෂය රු.123,486 ක් වූ අතර උත්සව අත්තිකාරම් ණය ශේෂය රු.2,500 ක් වී තිබුණි. | වැඩ තහනම් කර ඇති රියදුරු මහතුන් දෙදෙනාගෙන් 2021.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂයන්හි එකතුව රු. 190,302කි. මෙම හිඟ ආපදා ණය ශේෂයයන් දෙක මේ වන විටත් ඇපකරුවන්ගෙන් අයකරමින් පවතින අතර වර්තමානයේදී හිඟ ශේෂය රු.178,910 ක් දක්වා අඩු වී ඇත. වැඩ තහනම් කර ඇති රියදුරු මහතාගෙන් 2021.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය රු.129,615 ක් වන අතර උත්සව අත්තිකාරම් ශේෂය රු.6,250කි. රාජ්‍ය සේවයේ නියුතු මෙම ණයකරුගේ බිරිඳගෙන් හිඟ ආපදා හා උත්සව ණය ශේෂ දැනටමත් අයකරමින් පවතින අතර මේවන විට හිඟ ආපදා ණය ශේෂය රු.123,486 දක්වාද උත්සව අත්තිකාරම් ණය ශේෂය රු.2,500 දක්වාද අඩු වී ඇත. | අප්‍රමාදව හිඟහිටි අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සේවය අතහැර ගිය නිලධාරීන් හත් දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. 901,198ක ණය ශේෂ අයවිය යුතුව තිබුණි. එම ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂ අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | සේවය අතහැර ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.212,639 ක් හිඟහිටි ණය ශේෂ අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි නිලධාරීන් තිදෙනාගෙන් අයවැය යුතු එකතුව රු.680,558 ක ණය ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇත. | අප්‍රමාදව හිඟ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 454 | • පෞද්ගලික ආරක්ෂක නිලධාරි කාර්යාලය (PSO) සහ අභ්‍යන්තර කටයුතු සම්බන්ධීකරණ අංශය විසින් භාණ්ඩ වට්ටෝරු ලේඛනය හෝ භා.ගා.ග.ප. 66 ලේඛනය සකස් කර 2022 මාර්තු 21 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ වට්ටෝරු පොත් භා.ගා.ග.ප.66 ලේඛන සකස් කිරීමට නියෝග නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | | • ප්‍රවාහන අංශයේ අයිතම 11 කට අදාළව භාණ්ඩ/ උපකරණ 23 ක් 2022 මාර්තු 21 දින වන විටත් පොත්වල ඇතුළත් කර නොතිබුණි. | මෙම භාණ්ඩ මේ වන විට වට්ටෝරු ලේඛනවලට ඇතුළත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | | • කොටුව ජනාධිපති මන්දිරයේ උද්‍යාන කාර්යාල (Garden Office) කාමරයේ ඇති අයිතම 46 කට අදාළව භාණ්ඩ/ උපකරණ 63 ක් උද්‍යාන පාලක විසින් 2022 මාර්තු 31 දින වන විටත් භාරදී නොතිබුණු අතර, එම භාණ්ඩ/ උපකරණ පොත්වල ඇතුළත් කර නොතිබුණි. | උද්‍යාන කාර්යාල (Garden Office) කාමරයේ ඇති අයිතම 09 කට අදාළ භාණ්ඩ / උපකරණ 12ක් පමණක් උද්‍යාන පාලකට අයත් භාණ්ඩ වන අතර, එම භාණ්ඩ / උපකරණ පොත්වල ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | • විවිධ අංශ අතර හුවමාරු වී තිබුණු, විධිමත් පරිදි භාණ්ඩ වට්ටෝරු ලේඛනවල සටහන් නොකරන ලද භාණ්ඩ හා උපකරණ 09 ක් විය. | නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | | • 2020 වර්ෂය සඳහා සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය තුළින් අනාවරණය වූ ජනාධිපති පෞද්ගලික ලේකම් අංශය (දෙවන මහල) විසින් භාණ්ඩ වට්ටෝරු ලේඛනගත නොවූ හා කිසිවකු විසින් නිකුත් කිරීම් නියෝග මඟින් පරිශ්‍රය වෙත හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය වෙත භාර දී නොතිබුණු භාණ්ඩ/ උපකරණ 08කට අදාළව අයිතම 12 ක් පොදු 141 නිකුත් කිරීම් නියෝග මඟින් 2022 මාර්තු 21 දින වන විටත් භාරදීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන්ට නිවැරදි කිරීමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | මු.රෙ. 715(2) | කොටුව ජනාධිපති මන්දිරය සඳහා 2022 මාර්තු 31 දින වන විට මන්දිර භාරකරුවකු ස්ථිරව පත්කර නොතිබුණු අතර එම රාජකාරි ආවරණය කිරීම සඳහා කාර්යාලය විසින් පාලන නිලධාරියකු පත් කර තිබුණි. | කොටුව ජනාධිපති මන්දිරය සඳහා මන්දිර භාරකරුවකු ස්ථිරව පත් කරන තුරු එම රාජකාරී ආවරණය කිරීම සඳහා පාලන නිලධාරි, එච්.එම්.ඒ.ආර්.බී. හේරත් මහතා පත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | මු.රෙ. 755 | • ජනාධිපති ලේකම්තුමාගේ කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භෞතිකව පරීක්ෂා කර නොතිබුණු අතර, පරිශ්‍ර අංශයට භාර | ජනාධිපති ලේකම්තුමාගේ කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීම සඳහා | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දී තිබූ භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිසි පරිදි පොදු 141 නිකුත් කිරීම් නියෝග මගින් භාර දී නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, ඒ අනුව නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | |
| • | 2020 වර්ෂය සඳහා සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය තුළින් ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාංශයට අයත් ජංගම දුරකථන 12 ක සහ IPAD 02 ක ඌනතාවයක් නිරීක්ෂණය වී තිබුණු අතර, 2022 මාර්තු 21 දින වන විටත් එම භාණ්ඩ විධිමත් පරිදි ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම භාණ්ඩ රැගෙන ගිය නිලධාරීන් වෙත දන්වා නැවත එම භාණ්ඩ විධිමත් පරිදි අංශය වෙත ලබාගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| • | පර්යේෂණ හා විශේෂ පැවරුම් අංශයෙන් තාවකාලිකව Printer – Samsung යන්ත්‍ර 01ක් “එක් රටක් - එක් නීතියක්” අංශයට නිකුත් කර තිබුණද, එය භෞතික පරීක්ෂාවට ලක් වී නොතිබුණු අතර, ඒ සඳහා ලිඛිත සටහනක් හෝ නිකුත් කිරීම් නියෝගද ලබාදී තිබුණු බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම අංශයේ Printer – Samsung යන අයිතමය “එක් රටක් - එක් නීතියක්” සඳහා වූ ජනාධිපති කාර්යසාධක බලකාය වෙත ලිඛිත සටහන් මගින් නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| • | විදේශ සබඳතා අංශයේ හා.ගා.ග.ප. 66 ලේඛනයට අනුව භාණ්ඩ වර්ග 06 ක ඌනතාවයක් දක්වා තිබූ අතර, එම භාණ්ඩ ලිපි මගින් විවිධ අංශ වෙත පවරා දී තිබුණද, ඒවා ආපසු භාරදී ඇති බව තහවුරු කර, විදේශ සබඳතා අංශයේ | මෙම භාණ්ඩ විධිමත්ව අදාළ අංශ වෙත භාරදීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | බඩු වට්ටෝරු ලේඛනයෙන් ඉවත්කර නොතිබුණි. | | |
| • | හිටපු ජනාධිපතිතුමන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරිනියකගේ නිල රියදුරෙකු විසින් කළ පෞද්ගලික ඉල්ලීමක් මත ගබඩාවෙන් ජංගම දුරකථනයක් කිසිදු විධිමත් ලිඛිත ලියවිලිවලින් තොරව ලබාදී තිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| • | කොටුව ජනාධිපති මන්දිරයේ නව මන්දිර භාරකරු වෙත පැරණි මන්දිර භාරකරු විසින් වට්ටෝරු භාණ්ඩ ලේඛන අංක 9 සහ 10 හි භාණ්ඩ භාරදී නොතිබුණි. එම ලේඛනවල ඇතුළත් භාණ්ඩ ජනාධිපති ආරක්ෂක අංශයේ සමීප ආරක්ෂක අංශය, නාවික හමුදාව හා විශේෂ කාර්ය බලකාය යන අංශ වෙත ලබාදී තිබුණු නමුත් ඒවායේ භාරකාරත්වය සඳහා වගකිව යුතු පුද්ගලයකු නොවීය. ලේඛන අංක 10 හි ඇතුළත් වූ භාණ්ඩ පිළිබඳ විස්තර සමීක්ෂණ මණ්ඩල වාර්තාවේද දක්වා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර, එම පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලැබුණු පසු ඉදිරි පියවර ගැනීමට කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| • | කතරගම ජනාධිපති මන්දිරයේ භා.ගා.ග.ප. 66 ලේඛනයේ ඌණතාවයක් ලෙස දක්වා තිබූ Wood Screen 02 ක් 2014 පෙබරවාරි 27 දිනද, LG TV 21” Full Model රූපවාහිනී යන්ත්‍රයක් 2013 | මෙම අයිතමයන් සම්බන්ධයෙන් පරීක්ෂා කරමින් පවතින අතර, අදාළ තොරතුරු තහවුරු කර ගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඔක්තෝබර් 29 දිනද, අරලියගහ මන්දිරයට ගෙන ගොස් තිබූ අතර 2022 මාර්තු 21 දින වන විටත් නැවත මන්දිරය වෙත එය ලැබී නොතිබුණි. | | |
| | | ● කතරගම ජනාධිපති මන්දිරයේ භා.ගා.ග.ප. 66 ලේඛනයේ ඌණතාවයක් ලෙස දක්වා තිබූ Sharp Q072 ෆැක්ස් යන්ත්‍රයක් 2013 ජූලි 14 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය වෙත භාර දී තිබූ නමුත් 2022 මාර්තු 21 දින වන විටත් නැවත මන්දිරය වෙත ලැබී නොතිබුණි. තවද, Samsung 81cm LED රූපවාහිනී යන්ත්‍ර 01 ක් හා Samsung 40" LED රූපවාහිනී යන්ත්‍ර 01 ක් වට්ටෝරු පොත්වලින් ඉවත් කර ඇති බවටත්, තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | Samsung 40" LED රූපවාහිනී යන්ත්‍ර 01 ක් හා Samsung 81cm LED රූපවාහිනී යන්ත්‍ර 01 ක් වට්ටෝරු පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත..අනෙකුත් අයිතමයන් සම්බන්ධයෙන් පරීක්ෂා කරමින් පවතින අතර, අදාළ තොරතුරු තහවුරු කර ගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iv) | මු.රෙ. 760(අ) | ආරක්ෂක සම්බන්ධීකරණ අධ්‍යක්ෂ කාර්යාලයේ අපහරණය සඳහා ඉදිරිපත් කර තිබූ කැමරා උපකරණය (Camera - NIKON B500) සම්බන්ධයෙන් අපහරණය කිරීමේ කටයුතු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම Camera – NIKON B500 අයිතමය නැවත අදාළ අංශයේ තිබී හමුවී ඇති අතර, මෙම වර්ෂයේදී අපහරණය කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (v) | මු.රෙ. 772 | කොටුව ජනාධිපති මන්දිරයේ පැරණි විදුලි සෝපානය ඉඩ ප්‍රමාණවත් නොවීම මත ගලවා ඉවත් කර ඇති අතර, එහි මෝටරය ඇතුළු ගලවා ඉවත් කරන ලද කොටස් සිව් මහල් ගොඩනැගිල්ල අසල තබා තිබුණි. එම සෝපානය | ක්‍රියාකාරී තත්ත්වයේ පවතින පැරණි විදුලි සෝපානය කොටුව මන්දිරය සඳහා අවශ්‍ය නොවන බැවින් ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ආරක්ෂිතව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක්‍රියාත්මක තත්ත්වයේ පැවති පැරණි විදුලි සෝපානයක් බැවින්, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි ප්‍රයෝජනයට ගත හැකිව තිබුණත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ගබඩා කර ඇත. | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 ඡේදය ප්‍රකාරව, මු.රෙ. 756 (6) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කළ යුතු කාල රාමුව දක්වා තිබුණි. මුදල් රෙගුලාසිය ප්‍රකාරව 2021 දෙසැම්බර් 15 දින හෝ ඊට පෙර සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතුව තිබුණත්, එසේ කර නොතිබුණි. 2022 මාර්තු 21 දින වන විටත් කාර්යාලයේ වාහන පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 02 දිනැති ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන ඒකකය සම්බන්ධ අභ්‍යන්තර විගණන වාර්තාව ප්‍රකාරව කටයුතු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කාර්යාලයේ වාහන සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වාහන සමීක්ෂණ කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනාධිපතිවරයාගේ ගම සමඟ පිළිසඳරක් යන වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී ජනාධිපති කාර්යාලය විසින් ආරම්භ කරන ලද කෝට්ටේ රජමහා විහාරයේ විදුලි ගේට්ටුව සවි කිරීම, මැදිවක පල්ලෙවෙල ශ්‍රී උපෝසථාරාම විහාරස්ථානයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම හා එම විහාරස්ථානයේ යෝජිත නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම, කැගල්ල දැරණියගල පොත්දෙන්කන්ද මහා | ඉටු කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම, කොවිඩ් වසන්ගතය හේතුවෙන් සාපයුම්කරුවන්ගෙන් විෂයයන් ලබා ගැනීම ප්‍රමාදවීම හා කාලගුණ සාධක බලපෑම් නිසා මෙම ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි විය. | කාර්යයන්හි අපේක්ෂිත නිමැවුම ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම, හිඟුරක්ගොඩ රජරට මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය වටා කාණු පද්ධතිය ඉදිකිරීම හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සහ හෙට්ටිපොළ රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකය ස්ථාපිත කිරීම යන ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර නොතිබුණි.

**3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද මත්තමුවේ විහාරයේ සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීම, මාතර කොකාවල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩාගාරය ඉදිකිරීම, මැදිවක මප/තෙල්/මැදිවක ප්‍රාථමික විද්‍යාලයේ කාමරයක් පරිගණක විද්‍යාගාරයක් ලෙස බෙදා වෙන්කර ගැනීම, මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිට ගුවන් පාලම ඉදිකිරීම, ත්‍රි / මැදවච්චිය (බක්මීගම) විද්‍යාලයේ ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීම, බදුල්ල හල්දුම්මුල්ල, කුමාරතැන්න හා වලල්ලාවිට යට්ටපාත මහජන ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම සහ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් දික්වැල්ල බතීගම රෝහල වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදීම යන ව්‍යාපෘති සඳහා ජනාධිපති කාර්යාලය විසින් එකතුව රු.66,146,710 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර, ඉන් රු.50,382,682 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.15,764,028 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය, සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 69 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි විය. | කාර්යයන් අපේක්ෂිත පරිදි අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනාධිපති කාර්යාලය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු වාහන 56 ක භෞතික පැවැත්ම තහවුරු කර ගෙන නොතිබුණි. එසේ කාර්යාලයේ නොතිබුණු එම වාහන සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කළ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචිව තිබෙන වාහන පිළිබඳව තොරතුරු කැඳවීම් කර පොලිස්පති වෙත ලිපි යොමු කර ඇති අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීම් සිදු කෙරෙමින් පවතී. | කාර්යාලයේ වාහන භාවිතය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම හා එය අධීක්ෂණය කළ යුතු වීම. |
| (ආ) | ජනාධිපති කාර්යාලය, ජනාධිපති මන්දිර හා ජනාධිපති ආරක්ෂක අංශවල ලිපිනයන් යටතේ වෙනත් පෞද්ගලික නම්වලින් ලියාපදිංචි කර තිබූ වාහන 45 ක් පැවැතුණි. ඒ අනුව, ජනාධිපති කාර්යාලය හා ඒ ආශ්‍රිත ලිපිනයන් යටතේ වෙනත් පෞද්ගලික නම්වලින් වාහන ලියාපදිංචි වීමට හෝ එම ලිපිනයන් භාවිතා කිරීමට හේතු වූ කරුණු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචිව තිබෙන වාහන පිළිබඳව තොරතුරු කැඳවීම් කර පොලිස්පති වෙත ලිපි යොමු කර ඇති අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීම් සිදු කෙරෙමින් පවතී. | කාර්යාලයේ වාහන භාවිතය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම හා එය අධීක්ෂණය කළ යුතු වීම. |
| (ඇ) | ජනාධිපති කාර්යාලය නමින් ලියාපදිංචි කර තිබුණු වාහන 20 ක් වෙනත් ආයතනවලට නිකුත් කර තිබුණු නමුත්, ඒවා නැවත පවරා ගැනීමට හෝ එම වාහන අදාළ ආයතන වෙත විධිමත් ලෙස පැවරීමට හෝ 2022 මාර්තු 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචිව තිබෙන වාහන පිළිබඳව තොරතුරු කැඳවීම් කර පොලිස්පති වෙත ලිපි යොමු කර ඇති අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීම් සිදු කෙරෙමින් පවතී. | කාර්යාලයේ වාහන සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර වෙනත් ආයතන වෙත ලබා දී තිබුණු වාහන නිසි පරිදි පවරාදීම් සිදු කළ යුතු වීම. |
| (ඈ) | වෙනත් ආයතනවලට අයත් වාහන 13 ක් ජනාධිපති කාර්යාලය විසින් පරිහරණය කර තිබුණු අතර, එම වාහන ආපසු භාර දීමට හෝ ඒවා විධිමත්ව කාර්යාලය වෙත පවරා | ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචිව තිබෙන වාහන පිළිබඳව තොරතුරු කැඳවීම් කර පොලිස්පති වෙත ලිපි යොමු කර ඇති | කාර්යාලයේ වාහන සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය පවරාදීම් හෝ පවරාගැනීම් සිදු කළ යුතු |

| | | |
|---|---|---|
| ගැනීමට 2022 මාර්තු 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීම් සිදු කෙරෙමින් පවතී. | වීම. |

3.4 **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොටුව ජනාධිපති මන්දිරයේ භූගත මන්දිරයේ (Safety House) බිම් මහල තුළ භූගත ජලය හේතුවෙන් තෙතමනය රඳාපවතින බව නිරීක්ෂණය වී තිබුණු අතර, වායුසමීකරණ පද්ධතියද ක්‍රියාත්මක නොවන බැවින් එහි ගබඩා කර ඇති ගෘහ භාණ්ඩ තුළ ජල වාෂ්ප තැන්පත්ව ඒවාට හානි පැමිණ තිබුණි. | භූගත මන්දිරය සහ එහි ඇති ගෘහ භාණ්ඩ සතියකට වරක් කොටුව මන්දිරයේ පාලන නිලධාරීගේ අධීක්ෂණය යටතේ පිරිසිදු කිරීමට සහ එම මන්දිරයේ ඇති ගෘහ භාණ්ඩ හා අනෙකුත් උපකරණයන්හි නිසි පැවැත්ම තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. | භූගත මන්දිරයේ භෞතික පැවැත්ම ආරක්ෂා කිරීමට සහ නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම. |